කවරෙකු සතුව බිරියන් දෙදෙනෙකු වී ඔහු ඔවුන් දෙදෙනාගෙන් එකියක වෙත පමණක් නැඹුරු වූයේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහුගේ පැත්තක් ඇළ වූ තත්ත්වයේ ඔහු පැමිණෙනු ඇත

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු සතුව බිරියන් දෙදෙනෙකු වී ඔහු
ඔවුන් දෙදෙනාගෙන් එකියක වෙත පමණක් නැඹුරු වූයේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන
දිනයේ ඔහුගේ පැත්තක් ඇළ වූ තත්ත්වයේ ඔහු පැමිණෙනු ඇත." [صحيح] [رواه أبو داود والترمذي والنسائي وابن ماجه وأحمد]

එක් බිරියකට වැඩි ප්රමාණයක් තමන් සතුව සිට වියදම් කිරීම, නවාතැන් ලබා දීම, ඇඳුම් පැළඳුම් ලබා දීම, රාත්රිය ගත කිරීම වැනි ඔවුන් අතර හැකි පමණින් ඔවුන්ගේ නියමිත කොටස සමසේ වෙන් කිරීමෙහි ඔවුනට යුක්තිය ඉටු නොකළ තත්ත්වයේ මිය ගියේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහුට හිමිවන දඬුවම ඔහුගේ ශරීරයේ පැත්තක් ඇළ වී තිබීමය. ඔහු මෙලොව කටයුතු කිරීමේ දී පැත්තකට නැඹුරු වූ සේම, ඔහුගේ මෙම අපාරධය සඳහා ඔහු සතු දඬුවම වන්නේ ද එසේ පැත්තකට ඇළවී තිබීමයි.

https://sunnah.global/hadeeth/si/show/58125